# 19 විනෝද ගමන

මම සීගිරිය බලන්න ආසාවෙන් සිටියෙමි. මම මේ ගැන තාත්තාට කීවෙමි. අයියා ද එය අසාගෙන සිටියේ ය. නංගී ද සෙල්ලම් කරමින් සිට එතනට ආවා ය. "අපි ඔක්කොම සීගිරිය බලන්න යමු" තාත්තා අපට පැවැසුවේ ය.



සීගිරියට යන අතරමග පාරේ දී අපට මුවෙකු හමු විය. ඒ මුවා අප දැක කැලයට දිව්වේ ය. ඊට එහායින් තවත් මුවෙක් තණ කමින් සිටියේ ය. එක මුවෙක් ඔළුව උස්සා අප දෙස බලා සිට වනය තුළට දිව ගියේ ය. සීගිරිය වටේ ම ගස් පිරී ඇත. එහි එක ගසක් මල්වලින් පිරී තිබේ. ඒ ගස ඉතා ම ලස්සන ය. ඒ මොනවාදැයි මම අම්මාගෙන් ඇසුවෙමි. "ඒ ඇහැළ ගහක්" යැයි අම්මා කීවා ය. මම ඇහැළ මල් පොකුරු දැක සතුටට පත් වුණෙමි.

අපි සියලුදෙනා ම සිගිරි පර්වතයට නැංගෙමු. හැම පැත්තෙන් ම ආ මිනිස්සු සීගිරිය නරඹති. එක් මිනිසෙක් තාත්තා වෙතට පැමිණියේ ය. ඔහු තාත්තාට මොනවාදෝ පැවසී ය. තාත්තාත් ඒ මිනිසාත් සතුටින් කතා කරති. ඔවුහු සතුටින් සිනාසෙති. ඒ මිනිසා තාත්තාට සුබ පතා යන්නට ගියේ ය. " ඒ මගේ යාළුවෙක් " තාත්තා කීවේ ය.

සීගිරිය කඳු මුදුනට ම ගිය අපි එහි ඇති මාලිගාවේ නටබුන් ද නැරඹුවෙමු. ඒවා සතුටින් නරඹා පහළට බසින විට ඉර බැස යමින් තිබුණි. නංගීත්, අයියාත්, මමත් වෙළෙඳසැල්වලින් රස කැවිලි හා සෙල්ලම් බඩු මිල දී ගත්තෙමු. අම්මා ගෙදර රැගෙන යාමට එළවළු ද මිල දී ගත්තා ය.

## ක්‍රියාකාරකම : 1

ඉහත පාඩමෙහි මුල් ඡේද දෙක ඔබේ අභ්‍යාස පොතේ පිටපත් කරන්න.

පහත දැක්වෙන වාක්‍ය රටාව දෙස බලන්න. එම වාක්‍යවල කළු කර ඇති පද වටහා ගන්න.

i. මම මේ ගැන තාත්තාට **කීවෙමි.**

ii. අපි සීගිරිය බලන්න **යමු.**

iii. අයියා එය අසාගෙන **සිටියේ ය.**

මේ වාක්‍යවල **මම, අපි, අයියා** යන පද උක්ත පද ලෙස හැඳින්වේ. **කීවෙමි, යමු, සිටියේ ය.** යන පද ආඛ්‍යාත පද ලෙස හැඳින් වේ. ලිවීමේ දී වාක්‍යවල යෙදෙන එක් එක් උක්ත රූපයට අනුව යොදන ආඛ්‍යාත පද වෙනස් බව ඔබට වැටහෙන්නට ඇත.

පහත වාක්‍ය දෙස ද බලන්න.

i. **නංගී** ද එතනට **ආවා ය.**

ii. **ඔහු** තාත්තාට මොනවාදෝ **පැවසී ය.**

iii. **ඔවුහු** සතුටින් **සිනාසෙති.**

## ක්‍රියාකාරකම : 2

දී ඇති වාක්‍යවල හිස්තැනට සුදුසු වචන, පාඩම තුළින් සොයා සම්පූර්ණ කර ලියන්න.

i. තාත්තා අපට ..............................................

ii. ...................................... සීගිරිය බලන්න ආසාවෙන් සිටිමි.

iii. අපි සියලුදෙනා ම සීගිරි පර්වතයට .......................................

iv. ......................................... තාත්තාට සුබ පතා යන්නට ගියේ ය.

v. අම්මා එළවළු ද මිල දී .................................................

## ක්‍රියාකාරකම : 3

ඉහත වාක්‍ය රටා අනුව හිස්තැනට ගැළපෙන පදය තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

උදා : මම පාඩම් කරමි. ( කරමි / කරති / කරයි )

i. මම දුන්නිඳ ......................................

( නරඹමි / නරඹයි / නරඹති )

ii. මම අම්මාට උදව් ......................................

( කරති / කරයි / කරමි )

iii. මම මල්වලට වතුර ......................................

( දමති / දමමි / දමයි )

iv. මම කවියක් ......................................

( කියමි / කියති / කියයි )

v. මම පොතක් ......................................

( බලයි / බලමි / බලති)

## ක්‍රියාකාරකම : 4

දී ඇති වාක්‍ය රටාව බලා වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

උදා : ( මම / අපි / ඔහු ) .......මම....... මිදුල පිරිසිදු කරමි.

i. ( මම / ඔහු / අපි ) ............................................ අඹයක් කඩමි.

ii. ( අපි / මම / ඔහු ) ............................................ කවි කියමි.

iii. ( අපි / ඔහු / මම ) ............................................ හිස පීරමි.

iv. ( ඔහු / අපි / මම ) ............................................ ඇඳුම් සෝදමි.

v. ( මම / අපි / ඔහු ) ............................................ ගීයක් ගයමි.

## ක්‍රියාකාරකම : 5

දී ඇති වාක්‍ය රටාව බලා වාක්‍යයේ හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

උදා : අපි දිනපතා පාසල් යමු. ( අපි / ඔහු / මම )

i. ............................................ පලතුරු කමු. ( මම, අපි, ඔහු )

ii. ........................................ අපේ පාසල රැක ගනිමු. (අපි, ඔහු, මා)

iii. ............................................ සාරධර්ම සුරකිමු. (අපි, මම, ඔහු )

iv. ............................................ යහ සිරිත් අගයමු. (මා, අපි, ඔහු )

v. ............................................ දෙමාපියන් නමදිමු. (ඔවුහු, ඔහු, අපි )

vi. අපි විනෝද ගමනක් ........................................... (යමු, යමි, යති )

vii. අපි නගරයට ......................................... (ගියෙමු, ගියහ, යති )

viii. අපි ලෙඩුන්ට උපස්ථාන ............................. ( කරති, කරමු, කරයි )

## ක්‍රියාකාරකම : 6

දී ඇති වාක්‍ය යුගලය දෙස බලන්න. පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

උදා : <u>ගොවියා</u> කුඹුරු <u>කොටයි.</u>

<u>ගොවියෝ</u> කුඹුරු <u>කොටති.</u>

i. ළමයා ප්‍රවෘත්තිවලට සවන් ......................... ( දෙයි / දෙති )

ii. ළමයි ප්‍රවෘත්තිවලට සවන් .......................... ( දෙයි / දෙති )

iii. මිනිසා පාලම ......................................... ( සාදති / සාදයි )

iv. මිනිස්සු පාලම ........................................ ( සාදති / සාදයි )

v. ඔහු චාරිකාවක් ........................................ ( යයි / යති )

vi. ඔව්හු චාරිකාවක් ..................................... ( යයි / යති )

vii.. කාන්තාව කවි ......................................... ( කියති / කියයි )

viii. කාන්තාවෝ කවි ..................................... ( කියති / කියයි )

## ක්‍රියාකාරකම් : 7

උක්ත පදයට ගැළපෙන ආඛ්‍යාත පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. ඉගෙනීමෙහි දක්ෂයෝ විභාගය සමත් ..........................................
ii. අපි වෙනදා මෙන් සතුටට පත් ........................................
iii. අයියා මාමාගේ ගෙදර ........................................
iv. මම දුන්හිඳ බලන්නට ......................................
v. ඔව්හු දිනපතා පාසලට ......................................
vi. රජතුමා සතුටින් රට පාලනය ......................................
vii. මම කිසිදින වරදක් ............................................
viii. අපි හෙට විනෝද ගමනක් ......................................

කළු කර ඇති පද විමසා බලන්න. එම වාක්‍ය හොඳින් කියවන්න.

i. **මුවා** අප දැක කැලයට දිව්වේ ය.
ii. **මුවෙක්** තණ කමින් සිටියේ ය.
iii. **එක මුවෙක්** ඔළුව උස්සා බලා සිටී.

i. ඒ **ගස** ඉතා ම ලස්සනයි.
ii. ඒ ඇහැළ **ගසක්**
iii. **එක ගසක්** මල්වලින් පිරී තිබුණි.

ඉහත වාක්‍යවල කළු කර ඇති නාම පදවලින් එක අයෙකු හෝ එක දෙයක් ගැන කියැවේ. ඒවා ඒකවචන නාම පද වේ.

## ක්‍රියාකාරකම : 8

ඉහත නිදසුන්වලට අනුව පහත දී ඇති සටහන සම්පූර්ණ කරන්න.

| | | |
|---|---|---|
| මල | මලක් | එක මලක් |
| ................................... | ළමයෙක් | ............................... |
| ................................... | ..................................... | එක මිනිසෙක් |
| රට | ..................................... | ............................. |
| ..................................... | දරුවෙක් | ............................. |
| ..................................... | කුරුල්ලෙක් | ............................. |
| මුවා | .................................... | ............................. |


නොමිලේ බෙදාහැරීම සඳහා ය

## ක්‍රියාකාරකම : 9

එවැනි නාම පද වාක්‍යවල යෙදෙන අයුරු වටහාගෙන දී ඇති අභ්‍යාස කරන්න.

ගස සුළඟට සෙලවෙයි.

ගසක් සුළඟට සෙලවෙයි.

එක ගසක් සුළඟට සෙලවෙයි.

i. ළමයා ගසට නගියි.

..............................................

..............................................

ii. මිනිසා කුඹුර කොටයි.

..............................................

..............................................

iii. කුරුල්ලා කූඩු තනයි.

..............................................

..............................................

iv. අලියා ගස් පෙරළයි.

..............................................

..............................................

v. ගවයා තණ කොළ කයි.

..............................................

..............................................

vi. පොත මේසය උඩ ඇත.

..............................................

..............................................

## ක්‍රියාකාරකම : 10

පහත සඳහන් ඡේදයේ හිස්තැන්වලට වඩාත් ගැළපෙන වචන වරහන් තුළින් තෝරා ඡේදය සම්පූර්ණ කරන්න.

පාරක් අයිනේ ................................ තිබුණා. ඒක අඹ ................................ ඒ ................................ උඩ ...................................... වහලා හිටියා. ඒ කහ ...................................... ඒ ................................... ඉදුණු අඹ ගෙඩියක් කමින් හිටියා. එතනට ............................. ආවා. ඒ ........................................ අර කුරුල්ලා දැකලා සතුටු වුණා. ඔහු හොඳ ...................................... .

(ගහ, ගහක්, එක ගහක්, කුරුල්ලා, කුරුල්ලෙක්, එක කුරුල්ලෙක්, ළමයා, ළමයෙක්, එක ළමයෙක් )